Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව

සති පාසල

විෂය- පෙරදිග සංගීතය

සතිය- 2

ශ්‍රේණිය - 9

සැකසුම - ඩබ්.එන්.ජී.චන්ද්‍රකාන්ති

ර/ නිවි/ ඇලපාත මහා විද්‍යාලය

**නිපුණතාව 1.0 - සංගීතයේ මූලිකාංග ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන/වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.**

**නිපුණතා මට්ටම 1 .1 - ආරෝහණයේ සහ අවරෝහණයේ විවිධ ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන හැකියා වර්ධනය කර ගනියි.**

**ක්‍රියාකාරකම 1.1.1 - භූපාලි රාගයේ ස්වර අභ්‍යාස**

**ඉහත 1.1.1 ක්‍රියාකාරකමට අදාළ ව සපයා ඇති අංක 01, 02, 03 පැවරුම් සම්පූර්ණ කරන්න.**

පැවරුම- 01

1. භූපාලි රාගය ආශ්‍රිත පහත සඳහන් ගීත ශ්‍රවණය කරන්න.

**(මධුරයාමේ, මන්නාරම් පිටි වැල්ලේ, මෙලොව තිබෙන අමිල නිමල,සටනෙකී ජීවිතේ දැන් )**

- https://youtu.be/p9YknXWVFCc
- https://youtu.be/kWuLXsJqytM

11. ස්වර පුවරුවක් මගින් ගීත වාදනය කිරීමට උත්සාහ කරමින් එම ගීත නිර්මාණයේදී සරිගපධසˆ යන ස්වර පමණක් යෙදී ඇති ආකාරය පිරික්සන්න.

111. එම ගීතවල පදමාලාව නිවැරදි ව ඔබේ අභ්‍යාස පොතේ සටහන් කරගන්න.

1v. නාදමාලාව තහවුරු වන තෙක් ඉතා හොඳින් මෙම ගීත ගයමින් රසවින්දනයට හුරුවන්න.

පැවරුම- 02

- භූපාලි රාගයේ ආරෝහණ - ***සරිගපධසˆ*** අවරෝහණ - ***සˆධපගරිස*** ලෙස යෙදෙන අතර පහත ආකාරයෙන් ස්වර අභ්‍යාස ගොඩනගා ගත හැකිය. ඒවා හොඳින් නිරීක්ෂණය කරන්න. ඒ අනුව ***ම සහ නි*** ස්වර නොයෙදෙන ආකාරයෙන් ස්වර අභ්‍යාස නිර්මාණය කිරීමට ඔබත් උත්සාහ කරන්න. ස්වර පුවරුවක් ආධාරයෙන් පහත දැක්වෙන ස්වර අභ්‍යාස ගායනයට/වාදනයට හුරු වන්න.

**1. සරිගරිස, සරිගපගරිස, සරිගපධපගරිස, සරිගපධසˆධපගරිස, සරිගපධසˆරිˆසˆධපගරිස...........**

**11.සරිගගරිස, සරිගපපගගරිස, සරිගපධධපපගගරිස, සරිගපධධසˆසˆධධපපගගරිස ...........**

පැවරුම - 03

1. අන්තර්ජාලයෙන් .භූපාලි රාගයට අදාළ ගායන/වාදන පරිශීලනයට යොමු වන්න. ඒවායෙහි ඔබට හඳුනා ගත හැකි ස්වර අභ්‍යාස සටහන් කරගන්න.